සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
**Department of Samurdhi Development**
ග්‍රාමීය සංවර්ධන , සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
Ministry of Rural Development, Social Security and Community Empowerment


මගේ අංකය / எனது இல / My No: DSD/HO/05/MF/08/01-චක්‍රලේඛ

ඔබේ අංකය / உமது இல / Your No: ..........................................

දිනය / திகதி / Date: 2026.10.10

**සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක :- 2026 / 08**

**සියලුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු පාලක මණ්ඩල/ බැංකු සමිති විධායක කමිටු සභාපතිවරුන්,**
**සියලුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති කළමනාකරුවන්,**

**<u>ඔක්තෝම්බර් 01 දිනට යෙදෙන ජාත්‍යන්තර ළමා දිනයට සමගාමීව ක්‍රියාත්මක කරනු ලබන කැකුළු හා සිසුරක ළමා ඉතුරුම් තැන්පතු ප්‍රවර්ධන වැඩසටහන.</u>**

## 1. හැඳින්වීම.

සමෘද්ධි ප්‍රජාමූල බැංකු ජාලය හා සමෘද්ධි වැඩසටහන යටතේ, ඉලක්කගත අඩු ආදායම්ලාභී ප්‍රජාවගේ දරුවන්ගේ අධ්‍යාපනය හා අනාගත සුරක්ෂිතතාවය ඇති කිරීම උදෙසා විවිධ වැඩසටහන් රැසක් දියත් කෙරේ. මෙම වැඩසටහන් අතරින් සමෘද්ධි ප්‍රජාමූල බැංකුව විසින් අනාගතය භාර ගැනීමට ඉදිරිපත් වන දරුවන්ගේ ඉතුරුම් හැකියාව ප්‍රගුණ කිරීම හා ප්‍රවර්ධනය සඳහා මෙන්ම අනාගත සුරක්ෂිතාවය ඇති කිරීමට කැකුළු හා සිසුරක නමින් ළමා ඉතුරුම් ගිණුමක් හඳුන්වා දී ඉතුරුම් තැන්පතු භාර ගැනීම සිදු කෙරේ.

ළමා ඉතුරුම් සඳහා වඩාත් ආකර්ශනීය හා ඵලදායි වාර්ෂික පොළී අනුපාතයක් හඳුන්වා දී ඇත. දැනට සමෘද්ධි බැංකු ජාලය පුරා ළමා ඉතුරුම් ගිණුම් මිලියන 0.87 ඉක්මවා ඇති අතර, එම ළමා ගිණුම්වල රු.මිලියන 9,451 ක මුදලක් තැන්පත් කර ඇත. මෙම ළමා ගිණුම් සංඛ්‍යාව හා තැන්පතු මුදල් තවදුරටත් වර්ධනය කිරීම සඳහා ජාත්‍යන්තර ළමා දිනය අළලා ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහනක් දියත් කිරීමට මෙම දෙපාර්තමේන්තුව තීරණය කර ඇත.

ඒ අනුව, 2026 ඔක්තෝම්බර් 01 දිනට යෙදෙන ජාත්‍යන්තර ළමා දිනයට සමගාමීව සමෘද්ධි ප්‍රජාමූල බැංකු කැකුළු හා සිසුරක ළමා ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහනක් දියත් කිරීමට මෙම දෙපාර්තමෙන්තුව තීරණය කර ඇත.

## 2. ප්‍රවර්ධන වැඩසටහනේ අරමුණු

i. ළමා පරපුර ඉතිරි කිරීමට හුරු කිරීම සඳහා පරිසරය සැකසීම.

ii. සිසුරක/කැකුළු තැන්පත් මුදල් රැස් කිරීම තුළින් බැංකු තැන්පතු අරමුදල් වැඩිකර ගැනීම.


1වන අදියර,4 වන මහල , සෙත්සිරිපාය , බත්තරමුල්ල. / 1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல / 1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி (நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி) / Director (Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2869824 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 28877** |

iii. ඉතුරුම් කිරීමට හුරු කිරීමත් සමඟ අධ්‍යාපනයට වඩාත් ප්‍රයෝජනවත් තිළිණයක් ලබාදීම තුළින්,ළමුන්ගේ අධ්‍යාපනයට අත දීමට කටයුතු කිරීම.

**3. ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන පැවැත්වෙන කාල සීමාව හා ප්‍රවර්ධන වැඩසටහනට අදාළ වන ඉතුරුම් ගිණුම්**

i. 2026 ඔක්තෝම්බර් මස 01 දින සිට 31 දින දක්වා ප්‍රවර්ධන වැඩසටහන පැවැත්වේ.

ii. කැකුළු, සිසුරක ළමා ඉතුරුම් තැන්පතු ගිණුම්

**4. ඉලක්ක සකස් කර ගැනීම හා දැනුවත් කිරීම**

4.1 මෙම ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන යටතේ සමෘද්ධි බැංකුවට හා ක්ෂේත්‍රගත නිළධාරීන්ට ඉලක්ක ලබා නොදේ. සමෘද්ධි බැංකුව විසින්ද ක්ෂේත්‍රගත සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ට ඉලක්ක ලබා නොදිය යුතුය.

4.2 සමෘද්ධි සංවර්ධන නිළධාරීන් ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන පිළිබඳ දැනුවත් කර, එම නිළධාරීන් හරහා දෙමව්පියන් හා ළමුන් දැනුවත් කළ යුතුය. ඒ සඳහා සමෘද්ධි බැංකු පාලක මණ්ඩල/ප්‍රජාමූල සංවිධාන සභාපතිවරුන් ඇතුළු සාමාජිකයින්ගේ සහය ලබාගත යුතුය.

4. 3 ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන සාර්ථක කරගැනීමට ප්‍රදේශයේ පාසැල් හා පූර්ව ළමා මධ්‍යස්ථාන භාර විදුහල්පතීන් / පාලිකාවන් දැනුවත් කර, කැකුළු හා සිසුරක ළමා ගිණුම් ආරම්භ කිරීමට ළමුන්ව යොමු කර ගැනීමට වැඩසටහනක් සකස් කර ගැනීම සිදු කළ යුතුය.

**5. ඉතුරුම් ළමා ගිණුම් හිමියන්ට තිළිණ ලබාදීම හා වියදම් දැරීම.**

i. තිළිණ හඳුන්වාදීම

| තැන්පත් මුදලහි වටිනාකම රු. | තිළිණ සඳහා වැය කළ හැකි උපරිම මුදල් සීමාව | යෝජනා කරන තිළිණය |
|---|---|---|
| රු.500- රු.3000 දක්වා | රු.100.00 | මුදල් ඉතුරුම් කැටයක් හෝ වෙනත් සුදුසු තිළිණයක් |
| රු.3000 ට වැඩි තැන්පත් මුදල් | තැන්පත් මුදලින් 5% ක් හෝ ඊට අඩු මුදලක් | තැන්පත් මුදල් වර්ගීකරණය කර, බැංකු විසින් අභිමත පරිදි තිළිණ තෝරාගත යුතුය. |

ඉහත උපදෙස් පරිදි තිළිණ සඳහා වියදම් දැරීමේ දී, ප්‍රවර්ධන කාලය තුළ බැංකුව රැස්කරන මුළු තැන්පත් මුදලට සාපේක්ෂව 5% නොඉක්මවන පරිදි මුදල් වැයකල යුතු බවද තවදුරටත් දන්වමි.

ii. තිළිණ සඳහා වැයවන වියදම, වැය ගිණුම - බැංකු කටයුතු ප්‍රවර්ධන ගිණුමට හර කළ යුතුය.

iii. තිළිණ මිලදී ගැනීමේ දී, සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක 2026/02 හි ඡේද අංක 5.4 හි උපදෙස් පරිදි ප්‍රාදේශීය/ බැංකු සමිති ප්‍රසම්පාදන කමිටු මගින් සිදුකර ගත යුතුය.

iv. සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතිය විසින්, සියලුම බැංකුවල එකම තිළිණයක් ලබාදීම සඳහා තිළිණ තෝරා ගැනීම බැංකු කළමනාකරුවන් සමඟ සාකච්ඡා කර කටයුතු කිරීම වඩාත් සුදුසු වේ.

v. සමෘද්ධි බැංකු පාලක මණ්ඩල අනුමැතිය යටතේ ළමුන් හා දෙමව්පියන් උනන්දු කිරීමට හා දැනුවත් කිරීමට අත් පත්‍රිකා මුද්‍රණය හෝ බැනර් පිළියෙල කරගැනීම සඳහා රු.5000/- ක මුදලක් වැය කිරීමට අවසර දෙනු ලැබේ. මෙම වියදම, බැංකු ප්‍රවර්ධන ගිණුමෙහි සටහන් කළ යුතුය.

06. මෙම වැඩසටහන සාර්ථක කරගැනීමට,ක්ෂේත්‍රගත නිළධාරීන් හා බැංකු පාලක මණ්ඩල /ප්‍රජාමූල සංවිධාන සභාපතිවරුන්/සාමාජිකයින්ගේ සහය අපේක්ෂා කරමි. මේ පිළිබඳව ඔබගේ ප්‍රමුක අවධානය යොමු කර කටයුතු කළ යුතු බව ද කාරුණිකව දන්වමි.

ධම්මික මුතුගල.
අධ්‍යක්ෂ ජනරාල්

**පිටපත් :-**

1. ලේකම් - ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය - කා.දැ.ස.
2. දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්- දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කා.දැ.ස./අ.ක.ස.
3. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - අ.ක.ස.
4. ප්‍රාදේශීය ලේකම් - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. - කා.දැ.ස./අ.ක.ස.
5. ප්‍රධාන අභ්‍යාන්තර විගණක - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - අ.ක.ස
6. සියලුම අංශ ප්‍රධානීන් -. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - අ.ක.ස
7. දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අ.ක.ස.
8. සභාපති - සමෘද්ධි ප්‍රජාමූල බැංකු මහා සංගමය -කා.දැ.ස./අ.ක.ස.